ශීර්ෂය 116. වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වටිනාකම රු. 40,000,000 ක් වූ වාහනයක් හා ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වටිනාකම හඳුනානොගත් වාහනයක් පිළිවෙලින් පසුගිය වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබුණද ඒවා මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ආදළ වාහන අංක පිළිබඳව විස්තර සැපයෙන්නේනම්, ප්‍රමාණවත් පිළිතුරක් ලබාදිය හැකිය.	අමාත්‍යාංශයට පවරාගෙන ඇති වාහන නිවැරදි වටිනාකමට ගිණුම්ගත කළ යුතුය.
(ii)	අමාත්‍යාංශයට අයත් නොවන එකතු වටිනාකම රු. 51,000,000 ක් වූ වාහන තුනක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම වාහන තුනෙන් දෙකක් ලංකා සතොස ආයතනයට ලබාදී ඇති අතර ඉදිරියේදී එම වාහන වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.	අමාත්‍යාංශයට අයත් නොවන වාහන නොපමාව වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	පසුගිය වර්ෂයේදී අමාත්‍යාංශය සමග ඒකාබද්ධ වූ ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන අංශයේ (වාණිජ දෙපාර්තමේන්තුවේ) වත්කම් පන්ති 07 කට අයත් එකතුව රු. 65,524,857 ක් වටිනා ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	වාණිජ දෙපාර්තමේන්තුව සඳහා 2024 වර්ෂයේදී (ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රවර්ධන අංශය) මෙම ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලබා දුන් අතර එම දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය නොවන වත්කම් මෙම අමාත්‍යාංශය වෙත පවරා නොමැත. 2025 වර්ෂයේදී නැවත 295 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලබා දී ඇති බැවින් 2025 වර්ෂයේදී මෙය නිවැරදි කෙරෙනු ඇත.	අමාත්‍යාංශයට අයත් සියලු වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(iv)	සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩ අයිතම 18 ක් අවස්ථා දෙකකදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට සහ ඉකුත් වර්ෂයේදී රු. 1,193,790ක්	එම සියලු භාණ්ඩ CIGAS පරිගණක වැඩසටහනෙහි ඇතුලත් කර නොතිබූ අතිරික්ත භාණ්ඩ තක්සේරු කමිටුවක්	අමාත්‍යාංශයට අයත් සහ අයත් නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවලට

වටිනා අයිතම 99ක් සහ වටිනාකම හඳුනා නොගත් අයිතම 50 ක් වශයෙන් කාර්යාල උපකරණ අයිතම 149ක් රාජ්‍ය ආයතන 10කට අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබුණද එම වත්කම් මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කර නොතිබුණි.	මඟින් වටිනාකම් තක්සේරු කර මේවන විට CIGAS පරිගණක වැඩසටහනට ඇතුළත් කර ඇත.	ඇතුලත් කිරීම හෝ ඉවත්කිරීම සිදු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුලදී වැය විෂයයන් 17 ක් සඳහා ලබාදී තිබු එකතුව රු. 412,500,000 ක් වු සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබු අතර වැය විෂයයන් 21 ක් සඳහා රු. 375,700,000 ක් වු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.193,218,401 ක එනම්, සියයට 50 සිට 96 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 50 අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙළ කර නොතිබුණි.	පැවති දේශපාලන තත්වය මත මාස කිහිපයක් අමාත්‍ය කාර්යාලයෙහි කටයුතු සිදු නොවීම, රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛ අනුව වියදම් කළමනාකරණය සිදු කිරීම හා වාණිජ දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර ඇති ගෙවීම් සඳහා අපේක්ෂිත වියදම් ඇති නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතුය. එසේ පිළියෙල කළ ඇස්තමේන්තු මත ලද ප්‍රතිපාදන මුළුමනින්ම උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු. 181,500,000 ක ප්‍රතිපාදනවලින් මු. රෙ. 66 මඟින් රු. 23,630,000 ක් වු ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 157,870,000 ක් විය. ඉන් අදාළ වියදම් දැරීමෙන්	නව අමාත්‍ය කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා ප්‍රතිපාදන මු. රෙ. 66 යටතේ මාරු කර ගෙන ඇති අතර ඊට අදාල ලේඛන නිසි පරිදි නොලැබීම නිසා 2025 ජනවාරි හිඟ වැටුප් හා දීමනා ගෙවා ඇත. රාජ්‍ය වියදම් කළමනාකරණය චක්‍රලේඛ	වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා තාත්විකව පිළියෙල කළ යුතුය. එසේ පිළියෙල කළ ඇස්තමේන්තු මත ලද ප්‍රතිපාදන මුළුමනින්ම උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.

අනතුරුවද රු. 43,395,489 ක ඉතිරියක් පැවති අතර එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ත් සියයට 97 ත් අතර පරාසයක පැවතීමෙන් අධි ප්‍රතිපාදන සලසාගෙන තිබු බව නිරීක්ෂණය විය.	අනුව වියදම් කළමනාකරණය, නිලධාරීන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හා අපේක්ෂිත වියදම් ඇති නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවිය.	

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය විෂයයන් 02කට අදාළ එකතුව රු.1,116,785 ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා නොතිබූ අතර වැය විෂයයන් 02 ක එකතුව රු.76,306 ක් වූ බැරකම් හා බැඳීම් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේ දී නිවැරදිව කටයුතු කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කර ඇත.	මූල්‍ය ප්‍රකාශනවල සියලුම බැරකම් හා බැඳීම් නිවැරදිව දැක්විය යුතුය.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී ලිඛිත සමාලෝචනයේ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධති පවත්වා ගෙන යාමට හා සමාලෝචනය කිරීමටත් අවශ්‍ය වෙනස් කම් සිදුකර වාර්තා කිරීමටත් කටයුතු කළ යුතුය.

(ආ)	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.	මෙම ප්‍රමාද වූ වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට හැකි උපරිමයෙන් කටයුතු කර ඇත. මෙම ප්‍රමාද වී ඇති සියලුම ආයතන වෙත ලිඛිතව ද, වාචිකව ද දැනුවත් කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නියමිත කාලපරිච්ඡේදය තුළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 6.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	අභ්‍යන්තර විගණකවරුන් බඳවා ගන්නා ලෙස අදාල ආයතන දැනුවත් කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරුන් පත්කිරීමටත් අභ්‍යන්තර විගණන කටයුතු නිසි පරිදි අඛණ්ඩව සිදු කිරීමටත් කටයුතු කළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය		**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ			
	(i) මු.රෙ.104 (3) හා (4)	සමාලෝචිත වර්ෂය තුල සිදුවී තිබූ වාහන අනතුරු 4 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තා නිකුත් කර නොතිබූ අතර එක් වාහනයක	වාහන 04 සම්බන්ධයෙන් පූර්ණ වාර්තා සකස් කිරීමට මේ වන විට නිලධාරියෙකු පත්කර ඇත.	වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නිශ්චිත කාලපරිච්ඡේදය

		අනතුර සිදු වී මාස 10ක් පමණ ගත වී ඇතත් ප්‍රාරම්භක වාර්තාව හෝ ඉදිරිපත්කර නොතිබුණි. තවද 2022 වසරේ පැවති දේශපාලන අර්බුදයේදී විනාශ වූ වාහන 04 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා සකස් කිරීමට මාස 05ක පමණ කාලයක් ගත කර තිබූ අතර පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.		තුළ පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළ යුතුය. වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ii)	මු.රෙ.110	දේශපාලන අර්බුදය අවස්ථාවේ හානි වූ වාහන 2 ක් සම්බන්ධයෙන් එකතුව රු. 53,290,469 ක් වූ හානි, හානි හා පාඩු ලේඛනයේ සටහන් කර නොතිබුණි.	ඉදිරියේදී විධිමත් ලෙස හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.	සියලුම හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් යාවත්කාලිනව පවත්වාගෙන යා යුතුය.
(iii)	මු.රෙ. 571(2) හා (3)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 10,850,886 ක් වූ අවුරුදු 2 සිට 5 දක්වා පැරණි පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කරනු ලැබේ.	වසර 02 වඩා පැරණි පොදු තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2021 මාර්තු 30 දිනැති අංක අමප/21/0458/313 /015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය II (ආ) සහ 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය 7.4 ඡේදය	2024 මැයි 02 දින අවසන් වූ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ බදු ගිවිසුම භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව 2025 පෙබරවාරි දක්වා දීර්ඝ කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු. 58,707,360 ක බදු කුලී මුදලක් ගෙවා තිබුණි.	ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන කිහිපයක් සහ අමාත්‍යාංශය එහි ස්ථාපිත කිරීමට 2021 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර 2021 වර්ෂයේ සිට බදුකරු සමඟ එළඹ තිබූ ගිවිසුම අනුව බදු මුදල් ගෙවා ඇත.	ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට පෙර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය.

(ඇ)	2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කිරීමෙන් තොරව අමාත්‍ය කාර්ය මණ්ඩලයට 2022, 2023 හා 2024 වර්ෂවලදී වැටුප් හා දීමනා සහ අතිකාල ලෙස රු. 57,943,272 ක් ගෙවා තිබුණි.	ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ආයතන සංග්‍රහය අනුව කටයුතු කිරීමට ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් මගින් අවශ්‍ය දැනුවත් කිරීම් කර ඇත. ඇඟිලි සළකුණු සටහන් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.	ඇඟිලි සලකුණු සටහන් මගින් පැමිණීම හා පියවීම සනාථ කර ගැනීමෙන් පසු වැටුප් හා අතිකාල ගෙවිය යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ බිම්මහලේ ස්ථාපිත වෙළඳසැල සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.		
(අ)	වර්ග අඩි 2,178 ක ස්ථාපිත වෙළඳසැල 2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා සමූපකාර තොග වෙළඳ සංස්ථාවටද 2023 අගෝස්තු සිට මේ දක්වා උමන්දාව ග්‍රීන් හට් නැමැති ආයතනයටද ව්‍යාපාර කටයුතු කරගෙන යාමට කුලියට දී තිබුණු අතර, ඒ සඳහා 2022 වරර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා හිඟ කුලී මුදල්, විදුලි බිල්පත් හා ජල බිල්පත් සඳහා එකතුව රු. 6,226,669 ක් අයවීමට තිබුණි. අවුරුදු 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණද අදාළ හිඟ මුදල් අයකර ගැනීමට සහ වෙළඳසැල හා අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් වෙන්ව ජල හා විදුලි මීටර් සවිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	බිම් මහලේ හිඟ විදුලිය ගාස්තු ගෙවන ලෙස දන්වා ලංකා සතොස ආයතනයේ සභාපති වෙත ලිපි යොමු කර ඇති අතර බිම් මහලේ වෙළෙඳසැල පිහිටි කොටසට අදාළ විදුලි හා ජල මීටර වෙනම සවි කරදෙන ලෙස ගොඩනැගිල්ලේ කළමනාකරු වෙත දන්වා ඇත.	හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමටත්, බාහිර පාර්ශව වෙත කුළී පදනමට ලබාදෙන ගොඩනැගිලි සඳහා ජල හා විදුලි මීටර් වෙන් වෙන්ව සවිකර ගැනීමටත් කටයුතු කළ යුතුය.

(ආ)	උක්ත වෙළඳසැල සඳහා අභ්‍යන්තර ගෘහ නිර්මාණ කටයුතු සඳහා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම් 146 ක් (අධි ශීතකරණ, රූපවාහිනී, මුදල් අයකැමි යන්ත්‍ර, රාක්ක, පරිගණක) මිලදී ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව තෝරාගත් පෞද්ගලික ආයතනයකට 2021 දෙසැම්බර් 29 දින රු.මිලියන 20 ක් ගෙවා තිබුණි. තවද එම භාණ්ඩ මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව බඩු ලේඛනවල ඇතුලත් කර නොතිබූ අතර විගණිත දිනය වූ 2025 ජනවාරි 16 දින වනවිට එම භාණ්ඩවලින් රු.3,293,800 ක් වටිනා අයිතම 13ක් අස්ථාන ගතවී තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	සැපයුම්කාර ආයතනය විසින් භාණ්ඩ අයිතම භාරදීම සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන ලෙස දන්වා එම ආයතනයට ලිපියක් යොමුකර ඇත.	ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුව විධිමත්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. සියලු ඉන්වෙන්ට්‍රි අයිතම මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛනවල ඇතුලත් කළ යුතුය. අස්ථානගත වී ඇති අයිතම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගත යුතුය.
(ඇ)	විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව උක්ත වෙළඳසැල මසකට රු.250,000 බැගින් 2023 සැප්තැම්බර් 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කුලියට දීමට ගිවිසුම්ගත වී තිබුණද, එම භූමි ප්‍රමාණය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් මාසිකව රු. 326,700 ක කුලියක් ගොඩනැගිලි හිමිකරුට ගෙවා තිබූ බැවින් 2023 සැප්තැම්බර් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 1,627,200 ක අලාභයක් සිදු වී තිබුණි.	අමාත්‍යාංශය සතුව මේ සම්බන්ධව ගොනු නොමැති අතර අදාළ කරුණු විශ්ලේෂණය කර ඉදිරියේදී ප්‍රමාණවත් පිළිතුරක් ලබාදීමට කටයුතු කරනු ලැබේ.	ගිවිසුම්වලට එළඹීමේදි රජයට පාඩු සිදු නොවන පරිදි විධිමත්ව කටයුතු කළ යුතුය. අමාත්‍යාංශයට සිදුව ඇති අලාභය අයකර ගැනීමට පරීක්ෂණ ආරම්භ කළ යුතුය

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු සමාලෝචිත වර්ෂය තුළදී ද ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි.		
(i) ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම. (ii) අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතිය පවත්වාගෙන යෑම, එම දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම. ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීමට හා බුද්ධිමය දේපල පද්ධතියක් ස්ථාපිත කිරීම.	ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති කෙටුම්පත මේ වනවිට සකස් කර ඇති අතර රජයේ වත්මන් ජාතික ආර්ථික ප්‍රතිපත්ති සමඟ ගළපමින් තවදුරටත් වැඩිදියුණු කිරීමට යෝජිතව ඇත. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල දත්ත ලබා ගැනීමේ යාන්ත්‍රණයක් සකස් කර වැඩි දියුණු කරමින් පවතී. ජාතික බුද්ධිමය දේපල සංරක්ෂණ ක්‍රමවේදයක් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු නොපමාව ඉටු කළ යුතුය.
(iii) පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල නීති අණපනත් යාවත්කාලීන හා සංශෝධන කඩිනම් කිරීම.		
(ආ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, 2003 අංක 36 දරන ජාතික බුද්ධිමය දේපල පනත හා 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත සේවා පනත සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සංශෝධනය කර අවසන් වී නොතිබුණි.		

4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගතවීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 11 අතරින් ආයතන 04 ක 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සභාගත කර නොතිබුණු අතර ආයතන 07 ක වාර්තා මාස 04 සිට අවු 1 ½ කට වැඩි කාලයක් ප්‍රමාද කර සභාගත කර තිබුණි. තවද ආයතන 10 ක 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තා 2025 අප්‍රේල් 30 දින වන විටත් සභාගත කර නොතිබුණි.	ප්‍රමාද සිදු වී ඇති සියලු ආයතන දැනුවත් කර ඇත.	නියමිත දිනට පෙර වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙනත් ආයතනවලට අයත් වාහන 21 ක් ද සමඟ 2025 මාර්තු 30 දින වන විට 32 ක් වූ අමාත්‍යාංශය පරිහරණය කරන වාහන සංඛ්‍යාව සඳහා අවුරුදු 02ක පමණ කාලයක සිට අනුයුක්ත කර ඇති රියදුරන් සංඛ්‍යාව 07 ක් පමණි. ඒ අනුව වාහන 20ක් පමණ ඌන උපයෝජිතව පැවතුණි.	අමාත්‍යාංශයට පවරා නොගත් වාහන අතුරින් ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින්, ඒවා අමාත්‍යාංශය නමින් පවරාගැනීමට කොම්ප්ට්‍රෝලර් වෙත ඉල්ලීමක් සිදුකර ඇත. සංචිතයේ දැනට ඇති වාහන 11 න් 7 ක්ම මීට පෙර සිටි වෙළෙඳ අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා හා එම කාර්යය මණ්ඩලය වෙත අනුයුක්ත කර තිබූ වාහන වන අතර 2024 සැප්තැම්බර් 21	අමාත්‍යාංශයේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් පමණක් තබාගෙන වෙනත් ආයතනවලට අයත් වාහන පවරාදීමට කටයුතු කළ යුතුය. අවශ්‍යතාවය අනුව රියදුරන් යොදවා ගැනීමටද කටයුතු කළ යුතුය.

		දිනෙන් පසු සංචිතයට අනුයුක්ත වාහන වේ. ලංකා සතොස ආයතන වෙත තාවකාලිකව ලබාදී තිබූ රථය නැවත සංචිතයට ඇතුලත් කර ඇත.	
(ආ)	2022 වසරේ දේශපාලන අර්බුදය ඇතිවූ අවස්ථාවේ හානි වූ වාහනයක් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු. 76,886,217 ක් වැය වන බව අදාළ සමාගම විසින් දන්වා තිබුණද 2023 සැප්තැම්බර් 20 දින ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබූ මුදල රු.24,000,000 ක් වීම නිසා මුදල ප්‍රමාණවත් නොවූ බැවින් විගණිත දින වනවිට වසර 2 ½ ක පමණ කාලයක් ගතවී තිබුණද අලුත්වැඩියාව පිළිබඳ තීරණ නොගෙන රක්ෂණ මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබූ අතර වාහනය සමූපකාර තොග වෙළඳ සංස්ථාව තුල ගාල් කර තිබුණි.	අදහස් දක්වා නොමැත.	වාහනය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ සී/ස රාජ්‍ය වාණිජ (සමූපකාර) තොග වෙළඳ සමාගම (State Trading Co-operative Wholesale Company Ltd) නමැති රාජ්‍ය සමාගම ප්‍රසිද්ධ කර තිබුණි. එසේ වුවද අමප/21/1313/313/045 හා 2021 අගෝස්තු 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම සමාගම ඈවර කිරීමට අමාත්‍යාංශ ලේකම්ට ලබා දී තිබූ නිර්දේශය 2025 අප්‍රේල් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද	අංක 2153/12 දරණ 2019 දෙසැම්බර් 10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම අමාත්‍යාංශය අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය නමින් පිහිටුවා ඇති අතර ඊට පෙර තොරතුරු අමාත්‍යාංශය සතුව නොමැත.	අදාළ සමාගම ඈවර කිරීමට කටයුතු කළ යුතු අතර විගණනයට තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

	යථෝක්ත සමාගම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් සලසා දෙන ලද ඇපකර වෙනුවෙන් මහජන බැංකුව වෙත 2013 මැයි 22 දිනට ගෙවීමට තිබූ හිඟ මුදල වූ රු.31,485,686 පියවීම සම්බන්ධයෙන් විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.		
(ආ)	2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 ගැසට් නිවේදනය අනුව සියලු විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන මෙම අමාත්‍යාංශය යටතට පැවරුණු අතර ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.		
(i)	රත්මලාන හා මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටි භූමියේ නීත්‍යානුකූල අයිතිය අදාල ආර්ථික මධ්‍යස්ථානයට පවරාගෙන නොතිබුණි.	අවශ්‍ය තොරතුරු කැඳවා ඇති අතර එම තොරතුරු ලැබුණු පසු පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ.	මධ්‍යස්ථානය පිහිටි භූමියේ නීත්‍යානුකූළ අයිතිය මධ්‍යස්ථානයට පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	රත්මලාන, පිළියන්දල, නරාහේන්පිට සහ මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන හා බදුකරුවන් අතර ඇතිකරගෙන ඇති එකඟතා ගිවිසුම්වලට පටහැනි ලෙස වෙළඳසැල් 128 ක් අතුරු බදු දී තිබුණි.	අවශ්‍ය තොරතුරු කැඳවා ඇති අතර එම තොරතුරු ලැබුණු පසු පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ.	ගිවිසුම් අනුව කටයුතු කළ යුතු අතර මධ්‍යස්ථාන බදු දීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය.
(iii)	නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 23 ක් හා වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 63 ක් සම්බන්ධයෙන් එළඹ තිබූ බදු ගිවිසුම් පිළිවෙලින් 2023 මැයි 31 දින ද 2018 වර්ෂයේ සිට ද අවසන් වී තිබුණ ද වාර්තාවේ දින වන විටත් විධිමත් ගිවිසුම්වලට එළඹී නොතිබුණි.	-එම-	ගිවිසුම් කාලය අවසන් වීමට පෙර විධිමත්ව ගිවිසුම්වලට එළඹිය යුතුය.

(iv)	පිළියන්දල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ 2022 සිට 2024 වර්ෂය දක්වාද, වේයන්ගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ 2023 හා 2024 වර්ෂ සඳහා ද මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	-එම-	නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(v)	ආර්ථික මධ්‍යස්ථානවල තනතුරු සඳහා බඳවාගැනීමේ නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.	-එම-	තනතුරු අනුමත කරගෙන ඒ සඳහා බඳවාගැනීමට නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය.
(vi)	තක්සේරු වාර්තා වලට අනුකූලව බදු කුලී නොගෙවීම නිසා 2024 දෙසැම්බර් 31 දිනට නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයේ හිඟ කඩ කුලී හා දඩ මුදල රු. 68,039,527 ක්ද, හිඟ ගබඩා කුලී රු.80,899,820 ක් ද, රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයේ හිඟ කඩ කුලිය හා දඩ මුදල රු. 2,088,623 ක්ද වශයෙන් අයකර ගත යුතුව පැවතුණි.	-එම-	නව තක්සේරු වාර්තා වලට අනුකූලව බදු කුලී අය කර ගැනීම සඳහා ගිවිසුම්වලට එළඹිය යුතුය.
(vii)	රු.21,072,873 ක ගිවිසුම්ගත වටිනාකමක් මත දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ බැංකු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ රු.5,132,543 ක් වූ මුළු අමතර වැඩ (Excess work) හා රු.1,873,917 ක් වූ මුළු අතිරේක වැඩ (Extra work) වශයෙන් රු.7,006,460 ක් වූ මුළු කොන්ත්‍රාත් විචලනයන් සඳහා	මාතලේ දිස්ත්‍රික් ඉංජිනේරු හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි විසින් මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තාවක් ලබාදුන් පසු පිළිතුරු ඉදිරිපත් කරනු ලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කොන්ත්‍රාත් විචලනයන් සඳහා අනුමැතිය ලබා ගැනීමට සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීමට මෙවැනි අවස්ථාවල කටයුතු කළ යුතුය.

	විචලන නියෝග ආකෘති පත්‍රය යොදාගෙන විධිමත්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද කොන්ත්‍රාත් විචලනයන්ගේ වටිනාකම මූලික කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 33 ක් පමණ වන බැවින් මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.		
(viii)	දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ඉකුත් වර්ෂවල සිට ලැබිය යුතුව පැවති හිඟ බදු කුලී, දඩ හා රථවාහන සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ගාස්තුවලින් පිළිවෙළින් රු. 1,027,978 ක්, රු. 7,700,611 ක් හා රු. 500,000 ක් ලෙස එකතුව රු. 9,228,589 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලින් කපාහැර තිබුණද ඒ සඳහා ස්ථාපනකරුගේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	භාර අරමුදලේ 8 (අ) ඡේදය අනුව කපා හැරීම සිදුකර ඇත.	ප්‍රමාණවත් ගිණුම් ශේෂයන් කපාහැර ඇති බැවින් ස්ථාපනකරුගේ අනුමැතිය ලබාගත යුතුය.
(ix)	දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය සතු කඩකාමර 157 න් ව්‍යාපාර ඒකක 126 ක් සමග ගිවිසුම්ගතවීමකින් තොරව වසර 5 ත් වසර 25 ත් අතර කාල පරාසයක් තුළ ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යමින් පැවතුණි.	අමාත්‍යාංශය මගින් ප්‍රතිපත්තිමය තීරණයක් නොගැනීම හේතුවෙන් බදු ගිවිසුම් ලබාදීම ප්‍රමාද වී ඇති අතර බදු ගිවිසුම් ලබා දීම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	සියලුම කඩ කාමර සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය.

(x)	දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාරික ඒකක 157 ක් සම්බන්ධයෙන් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කුලියට අඩු මාසික කුලියක් භාරය විසින් අය කිරීම මත 2023 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා රු. 59,359,624 ක අලාභයක් භාර අරමුදලට සිදුවී තිබුණි. තක්සේරු කුලිය අයකර ගැනීම සඳහා 2017 ජනවාරි 24 දිනැති භාර ප්‍රකාශයේ 8 වන ඡේදයේ (අ) බලතල ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද 2022 වර්ෂයේ තක්සේරු වාර්තාවල වලංගු කාල සීමාව වූ වර්ෂ 3ක් ඉක්මවා ගොස් මාස 03 ට ආසන්න කාලයක් ගතවී තිබුණද 2025 මාර්තු 25 වන විටත් නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.	කඩිනමින් නව තක්සේරු ඇතුලත් කොට බදු ගිවිසුම් වලට එළඹීමට අවධානය යොමු කරනු ලැබේ. නැවත තක්සේරු කිරීම සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.	තක්සේරු කර තක්සේරු කුලිය අය කිරීමට කටයුතු කළ යුතු අතර භාර අරමුදලට අලාභ සිදු නොවන ආකාරයෙන් කටයුතු කළ යුතුය.
(xi)	ගුණාත්වයෙන් යුතු, නාස්තියෙන් තොර වූ එළවලු හා පළතුරු නිෂ්පාදනය ඇති කරමින් නිරන්තරයෙන් ගොවියාගේ ආදායම වැඩි කරලීම සහ ගොවියාගේ නිෂ්පාදනයට ඉතාම සාධාරණ වූත් ආකර්ෂණීය වූත් මිලක් ලබා දීම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ මෙහෙවර වුවද මධ්‍යස්ථානය ස්ථාපිත කර වර්ෂ 26 ක් ගත වී තිබුණද අස්වැන්න ආරක්ෂා කර ගැනීමට මිල පාලනය කිරීමට හෝ තීරණය කරන ලද මිල	ගොවි නිෂ්පාදන මිල තීරණය වනුයේ වෙළඳපල ඉල්ලුම හා සැපයුම අනුව බැවින් එය පාලනය කිරීමට කළමනාකරණ භාරයට හැකියාවක් නොමැත.	මධ්‍යස්ථානයේ අරමුණු ඉටුවන පරිදි කාර්යයන් සැලසුම් කළ යුතු අතර ඒ අනුව කටයුතු කළ යුතුය.

	ප්‍රසිද්ධ කිරීමට කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කළමණාකාරීත්වය අපොහොසත් වී තිබුණි.		
(xii)	දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල යෝජිතව තිබූ ක්‍රියාකාරකම් 07න් 06 ක්ම ක්‍රියාත්මක කිරීම අත්හැර දමා තිබුණි. එහිදී 2022 වර්ෂය තුළ මිනින්දෝරු සැලසුම් සකස්කිරීම වෙනුවෙන් රු. 510,000 ක් වැයකර තිබුණද ක්‍රියාත්මක කිරීම අත්හැරදැමීම මත එකී වියදම නිෂ්කාර්ය වී තිබුණි.	මාතලේ දිස්ත්‍රික් ඉංජිනේරු හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි විසින් මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තාවක් ලබාදුන් පසු පිළිතුරු ඉදිරිපත් කරන බව.	ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී ප්‍රායෝගික තත්වයන් සලකා බැලිය යුතු අතර පිළියෙළ කල සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය.
(xiii)	තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ 2016 අගෝස්තු 09 දිනැති ඉදිරි වසර 02 ක් සඳහා වලංගු තක්සේරු වාර්තාව පදනම් කර ගෙන 2023 දෙසැම්බර් දක්වාම කඩ කුලී අය කර තිබුණි. ඒ අනුව කඩ කාමර වසර දෙකකින් පසු නැවත තක්සේරු නොකිරීම හේතුවෙන් වසර 05 ක් සඳහා නව තක්සේරු කුලී මත ලැබිය හැකිව තිබූ කඩ කුලී ආදායම් අහිමි වී තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	තක්සේරුවේ වලංගු කාලය අවසන් වීමට පෙර නැවත කඩ කාමර තක්සේරු කිරීමටත් නව තක්සේරු වටිනාකම මත කුලී අය කිරීමටත් කටයුතු කළ යුතුය.
(xiv)	තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තඹුත්තේගම කොට්ඨාශයේ ඔරුගලයායෙන් අක්කර 05.07 ක භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලබා	පිළිතුරු ලබා දී නොතිබුණි.	ඉඩම නීත්‍යානුකූලව භාරගෙන අරමුණට යෙදවීමට කටයුතු කළ යුතුය. බදු මුදල් නියමිත දිනට නොගෙවීම මත ගෙවීමට සිදුවූ දඩමුදල වගකිවයුතු නිළධාරීන් වෙතින් අයකර ගැනීමට සුදුසු පරිදි පරීක්ෂණයක්

	ගැනීමට 2020 සැප්තැම්බර් 16 වන දින අනුමැතිය ලැබී තිබුණ ද 2025 මාර්තු 05 දින වන විටත් එම ඉඩම නීත්‍යානුකූලව භාර ගෙන අදාළ අරමුණ වෙත යොදාගෙන නොතිබුණි. එහිදි දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීම සඳහා බදු මුදල් වශයෙන් 2020 වසරේ සිට 2025 වසර දක්වා බදු මුදල් විධිමත්ව නොගෙවීම මත දඩ මුදල් ලෙස රු.40,000 ක් හා ඒ සඳහා පොලී ලෙස රු.10,000 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවා තිබුණි.		පැවැත්විය යුතුය.
(xv)	තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය සඳහා ගලි පිරිපහදු යන්ත්‍රයක් ස්ථාපිත කිරීම හා වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම සඳහා 2022 අප්‍රේල් 26 දින රු. 9,195,162 ක් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයෙන් අනුමත කර තිබුණ ද, අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. මධ්‍යස්ථානයේ ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා 2024 වර්ෂයේ දී රු.1,218,500 ක මුදලක් වැය කර තිබුණු අතර උක්ත ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වසරකට මෙලෙස විශාල වැය බරක් දැරීමට සිදු වී තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	අනුමත කරන ලද ඵලදායි ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

(xvi)	ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට අයත් කඩ කාමර 45 ක් බදු දීමේදී විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි. තවද, බදුකරුවන් 40 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවීම් පැහැර හැර තිබුණු රු.3,699,797 ක බදු මුදල් අය කර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	එකඟවේ. ආර්ථික මධ්‍යස්ථානය 2003 වර්ෂයේ ආරම්භ කිරීමේදී කඩ බදුකරුවන් සමග ගිවිසුම්ගත වී නොතිබීම හේතුවෙන් නෛතික ක්‍රියාමාර්ගවලට යොමු වීමට නොහැකි වී ඇති අතර වරින්වර ලිඛිතව සහ වාචිකව හිඟ මුදල් ගෙවීමට බදුකරුවන් දැනුවත් කරයි.	බදුකරුවන් සමග විධිමත් බදු ගිවිසුම්වලට එළඹීමට වහාම කටයුතු කළ යුතු අතර හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.
(xvii)	ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට අයත් කඩකාමර සම්බන්ධයෙන් 2019 ඔක්තෝබර් 31 දින දක්වා පමණක් වලංගු වුන 2016 වර්ෂයේ කර තිබුණු තක්සේරුව අනුව, වර්ෂ 09 ක් කඩකාමර බදු දී තිබුණු බැවින්, එම බදු දේපළවලට අදාළ වර්තමාන බදු වටිනාකම් මත ලබාගැනීමට හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි.	එකඟවේ. නව තක්සේරු වාර්තාවක් ලබා ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 01 දිනැති ලිපිය මගින් සහ ප්‍රධාන පාරට මුහුණලා තිබෙන කඩකාමර 15 තක්සේරු කිරීම සඳහා 2022 අගෝස්තු 22 දින අමාත්‍යාංශයට දැනුම් දී ඇති අතර තක්සේරු කටයුතු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අත්තිකාරම් මුදල් ගෙවා ඇත.	බදු දේපළ බදුදීමේදි තක්සේරු කර එම වටිනාකම්වලින් බදු ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය.
(xviii)	කැප්පෙටිපොල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කළමනාකරණ භාරයේ අරමුදල් රු.මිලියන 194.6 ක් වැය කරමින් මහින් ආර්ථික මධ්‍යස්ථානය ආවරණය වන පරිදි වහලක් ඉදිකිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් අවසානය වන තෙක්ද ක්‍රියාත්මක කර නොතිබූ අතර, ප්‍රසම්පාදන කටයුතු සඳහා 2024 මැයි 30 දින බදුල්ල දිස්ත්‍රික්	වෙළඳ අමාත්‍යාංශය විසින් මෙම කාර්යය සම්බන්ධව ඉදිරි පියවර ගනු ලැබේ.	ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුය.

ලේකම් වෙත රු.500,000 ක් ලබා දී තිබූ අතර පුවත්පත් දැන්වීම වෙනුවෙන් රු.256,565 ක් වැය කර තිබුණි.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිත පවත්වා ගැනීමේ අරමුණින් ඉලක්ක 3 ක් යටතේ දඹුල්ල ගබඩා සංකීර්ණය ඉදිකිරිමේ සමස්ථ භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සියයට 75 සිට 100 දක්වා බව සඳහන් කර තිබුණි. එළවළු හා පළතුරු ගබඩා කර කල් තබා ගැනීමේ ශීතකරණ ගබඩා සංකීර්ණ ඉදිකිරිම හා මෙහෙයුම් ක්‍රියාවලිය එහි ජයග්‍රහණ දර්ශකය ලෙස දක්වා තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේදී ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත කාල සීමාව ඉක්මවා වසර 3 ½ ක් ගතකර ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද එහි මෙහෙයුම් ක්‍රියාවලිය 2025 අප්‍රේල් අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.	අවශ්‍ය තොරතුරු කැඳවා ඇති අතර එම තොරතුරු ලැබුණු පසු පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ.	එළවළු හා පළතුරු ගබඩා කර කල් තබා ගැනීමේ ශීතකරණ ගබඩා සංකීර්ණයේ මෙහෙයුම් ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය නිවැරදිව දැක්විය යුතුය.
(ආ)	ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර ආරක්ෂිත සංචිතයක් පවත්වා ගැනීම යටතේ අතිරේක සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඒ සම්බන්ධව දේශීය වශයෙන් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වල ආරක්ෂිත තොග පවත්වාගෙනයාමට නිසි ක්‍රමවේදයක් ඇති කිරීමට ද කටයුතු කර නොතිබුණි.	අවශ්‍ය තොරතුරු කැඳවා ඇති අතර එම තොරතුරු ලැබුණු පසු පිළිතුරු සැපයීමට කටයුතු කරනු ලැබේ.	ආහාර සංචිත පවත්වා ගැනීමේ නිසි ක්‍රමවෙදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

6. යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකුද අමාත්‍යාංශය යටතේ ඇති එක් එක් ආයතන සඳහා එහි පාලක මණ්ඩලය විසින් ද අභ්‍යන්තර විගණකවරු පත්කර ගත යුතු වුවද 2025 ජනවාරි 31 දින වන විට අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යාපාර ආයතන 07 ක වසර 01 ත් වසර 06 ත් අතර කාල පරාසයක් තුල අභ්‍යන්තර විගණක තනතුරු පුරප්පාඩුව පැවතුණි. තවද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, සමුපකාර සේවක කොමිෂන් සභාව හා වාණිජ දෙපාර්තමේන්තුව යන ආයතන තුනෙහි අභ්‍යන්තර විගණක තනතුර ස්ථාපිත කර නොතිබුණි.	අභ්‍යන්තර විගණකවරුන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ ආයතන දැනුවත් කර ඇත.	අභ්‍යන්තර විගණන තනතුර ස්ථාපිත කර නැති ආයතනවල එම තනතුර ස්ථාපිත කිරීමටත් අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති සියලුම ආයතනවල අභ්‍යන්තර විගණනය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය.